# පොලිස් මාධ්‍ය කොට්ඨාසය
## பொலிஸ் ஊடகப் பிரிவு
## POLICE MEDIA DIVISION
සුහුරුපාය, බත්තරමුල්ල

| | | | | | | | |
|---|---|---|---|---|---|---|---|
| තැ.පෙ.අංකය<br>த. பெ.இ<br>Po.Box No | 10120 | | | | | ෆැක්ස්<br>தொலைநகல<br>Fax | 011-2171635 |
| දුරකථන<br>தொலைபேசி<br>Telephone | 011-2887973<br>(HUNTING) | | වෙබ්.ලිපිනය<br>இணையதளம்<br>Web Site | www.Police.lk | | ඊ මේල්<br>மின்னஞ்சல்<br>E-mail | dir.media@police.gov.lk |


| | | | | | |
|---|---|---|---|---|---|
| මගේ අංකය<br>எனது இலக்கம்<br>My NO | 1829 / 2024 | ඔබේ අංකය<br>உமது இலக்கம்<br>Your No | / 2024 | දිනය<br>திக<br>Date | 11/12/2024<br>පැය 1520 |

**මාධ්‍ය නිවේදනය**

**ප්‍රධාන කර්තෘ / ප්‍රවෘත්ති කර්තෘ,**
**අධ්‍යක්ෂ ප්‍රවෘත්ති / ප්‍රවෘත්ති කළමණාකරු,**
**සියළුම මාධ්‍ය ආයතන.**

**අත්අඩංගුවට ගත් සැකකරුවකුට පොලිස් විශේෂ කාර්ය බලකා නිලධාරීන් වෙඩි තැබූ බවට එල්ල වූ චෝදනා ගරු අධිකරණය විසින් නිෂ්ප්‍රභ කරයි.**

2022.10.12 වන දින සංවිධානාත්මක අපරාධ කණ්ඩායමක් විසින් බලපිටිය RIU හෝටලය ආසන්නයේදී ත්‍රීරෝද රථ රියැදුරෙකුට වෙඩි තබා බරපතල තුවාල සිදු කිරීමේ සිද්ධියකට අදාළව එවකට පොලිස්පතිගේ නියෝග අනුව පොලිස් විශේෂ කාර්ය බලකා නිලධාරීන් කණ්ඩායමක් විසින් විමර්ශනයක් ආරම්භ කරන ලදී.

අදාළ විමර්ශනය පොලිස් විශේෂ කාර්ය බලකායේ පොලිස් පරීක්ෂක කොළඹගේ ඇතුළු නිලධාරීන් කණ්ඩායමක් විසින් සිදු කළ අතර එම විමර්ශනයේදී මෙම අපරාධය මෙහෙය වන ලද ප්‍රධාන සැකකරු දික්වැල්ල පොලිස් වසමේ සැඟව සිටියදී අත්අඩංගුවට ගන්නා ලදී. මෙසේ අත්අඩංගුවට ගත් සැකකරුගෙන් සිදු කරන ලද දීර්ඝ ප්‍රශ්න කිරීම් වලදී අනාවරණය කරගත් කරුණු අනුව වෙඩි තැබීම සඳහා යොදාගත් කාර් රථයට ව්‍යාජ අංක තහඩු සවිකරන ලද සැකකරු, අපරාධය සිදු කළ වෙඩික්කරු සහ වෙඩි තැබීමට යොදාගත් ගිනි අවියද සොයා ගන්නා ලදී.

මෙම අපරාධය දැනට බෙලරුස් රාජ්‍යයේ අත්අඩංගුවේ පසුවන කරන්දෙණියේ සුද්දා සහ ලොකු පැටී නැමති සංවිධානාත්මක අපරාධකරුවන්ගේ ආධාර අනුබල දීම මත මෙරට රැඳී සිටින මහේෂ් ඉන්දික නොහොත් ඇඹිලිපිටියේ පොඩි ඉන්දික නැමැති සැකකරුගේ මෙහෙයවීමෙන් සිදු කර ඇති බවට කරුණු අනාවරණය වී ඇත.

ඒ අනුව අත්අඩංගුවට ගත් ප්‍රධාන සැකකරු වන මහේෂ් ඉන්දික නොහොත් ඇඹිලිපිටියේ පොඩි ඉන්දික නැමැත්තා විශේෂ කාර්ය බළකා විමර්ශන නිලධාරීන් විසින් වැඩිදුර විමර්ශන කටයුත්තක් සඳහා අහුන්ගල්ල ප්‍රදේශයට රැගෙන ගොස් සිටියදී සැකකරු විසින් විශේෂ කාර්ය බලකා නිලධාරීන්ට සිදු කරන ලද වෙඩි තැබීමකදී, ඊට

විශේෂ කාර්ය බළකායේ පොලිස් පරීක්ෂක කොළඹගේ නිලධාරියා විසින් ප්‍රතිප්‍රහාර එල්ල කිරීමේදී සැකකරු බරපතල තුවාල ලබා රෝහල් ගත කිරීමෙන් පසු ජීවිතක්ෂයට පත් විය.

ජීවිතක්ෂයට පත් වූ සැකකරු මීට පෙර අවස්ථා කිහිපයකදී අපරාධයන් සඳහා පොලිස් අත්අඩංගුවට පත්ව ඇත. එනම්,

01. 2016.08.09 වන දින ගොඩකවෙල පොලිස් වසමේ නිවසකට රාත්‍රී කාලයේ ඇතුළු වී ලක්ෂ 37ක් වටිනා මුදල් සහ දේපළ කොල්ල කා පළායාමේදී කල්තොට පොලිස් වසමේදී අත්අඩංගුවට පත්ව ඇත.
02. 2017.06.26 වන දින රාගම පොලිස් වසමේදී T-56 ගිනි අවියක් පෙන්වා බිය ගන්වා මුදල් කොල්ලකෑම.
03. 2020.01.29 වන දින තණමල්විල පොලිස් වසමේදී හෙරොයින් සන්තකයේ තබා ගැනීම සම්බන්ධව අත්අඩංගුවට පත් වීම.

සැකකරු වෙඩි හුවමාරුවකදී මිය යාමට අදාළව බලපිටිය මහේස්ත්‍රාත් අධිකරණයේ විභාග වූ නඩුව සම්බන්ධව සිදු කළ දීර්ඝ විමර්ශනයකින් පසු 2024.07.21 වන දින තීන්දුව ප්‍රකාශයට පත් කරමින් විශේෂ කාර්ය බළකායේ වෙඩි තැබීම සිදු කළ පොලිස් පරීක්ෂක කොළඹගේ නිලධාරියා අත්අඩංගුවට ගෙන අධිකරණයට ඉදිරිපත් කරන ලෙසට අධිකරණය විසින් නියෝග කර ඇත.

ඉහත අධිකරණ නියෝග අනුව අහුන්ගල්ල පොලිස් ස්ථානය වෙත විශේෂ කාර්ය බළකා නිලධාරීන් කැඳවා වැඩිදුර ප්‍රකාශ සටහන් කර විමර්ශන ගොනුවක් සහ ඉහත නඩුවට අදාළ සියලු කාර්යය සටහන් සහිත නඩුවේ ලිපි පිටපත් සහිත ගොනුවක් ගරු නීතිපතිතුමාගේ උපදෙස් සඳහා යොමු කරන ලදී.

ගරු නීතිපතිවරයා විසින් ඊට අදාළව ලිපියක් යොමු කරමින් මෙම නඩු කෘත්‍යට අදාළව කිසිදු පුද්ගලයෙකුට එරෙහිව අපරාධ චෝදනාවක් ගොනු කිරීම සඳහා ප්‍රමාණවත් කරුණු / සාක්ෂි අනාවරණය වී නොමැති බැවින් වැඩිදුර නෛතික පියවර ගැනීමට අපේක්ෂා නොකරන බවට දන්වා ඇත. ඒ අනුව මෙම නඩුව 2024.11.05 වන දින බලපිටිය මහේස්ත්‍රාත් අධිකරණයේ කැඳවූ අවස්ථාවේ නීතිපතිතුමාගේ ලිපිය ඉදිරිපත් කරන ලද අතර, ගරු මහේස්ත්‍රාත්තුමා විසින් මේ සම්බන්ධව අවසන් නියෝගයක් ලබා දීම සඳහා නඩුව නැවත 2024.12.10 වන දිනට කැඳවීමට නියම කරන ලදී.

ඒ අනුව අදාළ නඩුව 2024.12.10 වන දින බළපිටිය ගරු මහේස්ත්‍රාත් අධිකරණයේදී නැවත කැඳවන ලද අතර එහිදී බලපිටිය ගරු මහේස්ත්‍රාත්තුමා විසින් මෙම නඩුව නිෂ්ප්‍රභ කරන ලදී.

එසේම මෙම සිද්ධියේ ප්‍රධාන සැකකරුගේ අනියම් බිරිඳ විසින් 2022.11.02 වන දින බලපිටිය මහේස්ත්‍රාත් අධිකරණයට ඉදිරිපත්ව විශේෂ කාර්ය බලකායේ අණදෙන නිලධාරි ජ්‍යෙෂ්ඨ නියෝජ්‍ය පොලිස්පති වරුණ ජයසුන්දර මහතා අදාළ සැකකරු අත්අඩංගුවට ගැනීම සඳහා සිවිල් ඇඳුමින් සැරසී වෑන් රථයකින් පැමිණි බවටද බොරු සාක්ෂි ලබා දී ඇත.

ඒ අනුව ජ්‍යෙෂ්ඨ නියෝජ්‍ය පොලිස්පති වරුණ ජයසුන්දර මහතා 2023.06.13 වන දින බලපිටිය ගරු මහේස්ත්‍රාත්තුමා දැනුවත් කිරීමට කටයුතු කළ අතර, ඊට අදාළව අපරාධ

පරීක්ෂණ දෙපාර්තමේන්තුව මඟින්ද විමර්ශනයක් සිදු කරන ලදී. අපරාධ පරීක්ෂණ දෙපාර්තමේන්තුව මඟින් සිද්ධිය සම්බන්ධව ගරු නීතිපති තුමා වෙත කරුණු වාර්තා කර ඇති අතර ඊට අදාළව නීතිපතිතුමාගෙන් ලද උපදෙස් අනුව අපරාධ පරීක්ෂණ දෙපාර්තමේන්තුව විසින් බොරු සාක්ෂි ලබාදීම යන චෝදනා මත අදාළ කාන්තාව අත්අඩංගුවට ගෙන අධිකරණයට ඉදිරිපත් කර ඇත. මීට අදාළ නඩුව නැවත 2025.03.25 දින කැඳවීමට නියමිතව ඇත.

**පොලිස් මාධ්‍ය කොට්ඨාසය.**